# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
# පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරුවල පුරප්පාඩු සඳහා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විශිෂ්ට චරිතයකින් යුත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** **තනතුරු නාමය - විද්‍යාත්මක නිලධාරී**
**සේවා ගණය - කණිෂ්ඨ කළමනාකාර**
**පුරප්පාඩු ගණන - 03**

**1.1 සුදුසුකම්**

**1.1.1** **<u>බාහිර අයදුම්කරුවන්</u>**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක, රසායන විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

**1.1.2** **<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

(ආ) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

(ඇ) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

(ඈ) බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිළධාරී සේවා ගණයේ තනතුරක වසර 08ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**1.2** **වැටුප් කාණ්ඩය** - JM 1-1

**1.3** **වැටුප් පරිමාණය** - රු. 42,600 – 10 x 755 – 18 x 1,135 – 70,580 (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව) 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 38,185/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**1.4** **වයස :** අවුරුදු 22ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**02.** **තනතුරු නාමය - මූල්‍ය නිලධාරි**
**සේවා ගණය - කණිෂ්ඨ කළමනාකාර**
**පුරප්පාඩු ගණන - 01**

**2.1 සුදුසුකම්**

**2.1.1** **<u>බාහිර අයදුම්කරුවන්</u>**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක, ගිණුම්කරණය/ කළමනාකරණය/ මූල්‍ය/ වාණිජවේදී යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

**2.1.2** **<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

(ආ) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

(ඇ) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

(ඇ) බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිළධාරී සේවා ගණයේ තනතුරක වසර 08ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**2.2 වැටුප් කාණ්ඩය** **-** JM 1-1

**2.3 වැටුප් පරිමාණය** - රු.42,600 – 10 x 755 – 18 x 1,135 – 70,580 (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව) 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 38,185/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**2.4 වයස :** අවුරුදු 22ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**03.** **තනතුරු නාමය - සහකාර පර්යේෂණ නිළධාරි**
**සේවා ගණය - බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිළධාරී**
**පුරප්පාඩු ගණන - 07**

**3.1 සුදුසුකම්**

**3.1.1** **<u>බාහිර අයදුම්කරුවන්</u>**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක, සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජ වැඩ/ සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම

**3.1.2 <u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**3.2 වැටුප් කාණ්ඩය** **-** MA 5 - 2

**3.3 වැටුප් පරිමාණය** - රු. 36,850- 10 x 755 – 15 x 930 – 5 x 1,135 - 64,025 (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව) 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 33,050/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**3.4 වයස :** අවුරුදු 22ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**04. තනතුරු නාමය - සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිළධාරි**
**සේවා ගණය - බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිළධාරී**
**පුරප්පාඩු ගණන - 05**

**4.1 සුදුසුකම්**
**4.1.1 <u>බාහිර අයදුම්කරුවන්</u>**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක, සමාජීය විද්‍යාවන් යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම

**4.1.2 <u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**4.2 වැටුප් කාණ්ඩය** **-** MA 5 - 2

**4.3 වැටුප් පරිමාණය** - රු. 36,850 – 10 x 755 – 15 x 930 – 5 x 1,135 - 64,025/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016) අනුව 2019 වර්ෂයේ මූලික වැටුප රු.33,050/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**4.4 වයස :** අවුරුදු 22ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**05. තනතුරු නාමය - සහකාර බාහිරසේවා නිළධාරි**
**සේවා ගණය - බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිළධාරී**
**පුරප්පාඩු ගණන - 04**

**5.1 සුදුසුකම්**
**5.1.1** <u>බාහිර අයදුම්කරුවන්</u>

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක, සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම

**5.1.2** <u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**5.2 වැටුප් කාණ්ඩය** - MA 5 - 2

**5.3 වැටුප් පරිමාණය** - රු. 36,850 – 10 x 755 – 15 x 930 – 5 x 1,135 - 64,025/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව) 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 33,050/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**5.4 වයස :** අවුරුදු 22ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**06. තනතුරු නාමය - උපදේශන සහකාර**
**සේවා ගණය - කළමනාකරණ සහකාර - තාක්ෂණික**
**පුරප්පාඩු ගණන -09**

**6.1 සුදුසුකම්**
**6.1.1** <u>බාහිර අයදුම්කරුවන්</u>

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක අදාල ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සටහන :
(අදාල ක්ෂේත්‍රය :- මනෝවිද්‍යාව/ උපදේශනය/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයන්)

**6.1.2** **<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**6.2 වැටුප් කාණ්ඩය** - MA 2-1

**6.3 වැටුප් පරිමාණය** - රු. 30,310 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 - 50,940/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව) 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 27,170/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**6.4 වයස :** අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**07. තනතුරු නාමය - බාහිරසේවා සහකාර**
**සේවා ගණය - කළමනාකරණ සහකාර - තාක්ෂණික**
**පුරප්පාඩු ගණන -04**

**7.1 සුදුසුකම්**

**7.1.1** **<u>බාහිර අයදුම්කරුවන්</u>**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක අදාල ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සටහන :
(අදාල ක්ෂේත්‍රය :- මනෝවිද්‍යාව/ උපදේශනය/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයන්)

**7.1.2** **<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**7.2 වැටුප් කාණ්ඩය** - MA 2-1

**7.3 වැටුප් පරිමාණය** - රු. 30,310 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 - 50,940/- කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 27,170/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**7.4 වයස :** අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**08. තනතුරු නාමය - මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු සහකාර**
**සේවා ගණය - කළමනාකරණ සහකාර - තාක්ෂණික**
**පුරප්පාඩු ගණන - 05**

**8.1 සුදුසුකම්**

**8.1.1** <u>**බාහිර අයදුම්කරුවන්**</u>

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක අදාල ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සටහන :
(අදාල ක්ෂේත්‍රය :- මනෝවිද්‍යාව/ ජනසන්නිවේදනය/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයන්)

**8.1.2** <u>**අභ්‍යන්තර අයදුම්කරුවන්**</u>

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**8.2 වැටුප් කාණ්ඩය** - MA 2-1

**8.3 වැටුප් පරිමාණය** - රු. 30,310 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 - 50,940/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව) 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 27,170/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**8.4 වයස :** අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**09. තනතුරු නාමය - හෙද නිළධාරී**
**සේවා ගණය - කළමනාකරණ සහකාර - තාක්ෂණික**
**පුරප්පාඩු ගණන -04**

**9.1 සුදුසුකම්**
**9.1.1** <u>**බාහිර අයදුම්කරුවන්**</u>

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක හෙද සේවය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**9.1.2** <u>**අභ්‍යන්තර අයදුම්කරුවන්**</u>

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**9.2 වැටුප් කාණ්ඩය** - MA 2-1

**9.3 වැටුප් පරිමාණය** - රු. 30,310 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 - 50,940/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව) 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 27,170/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**9.4 වයස :** අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**10. තනතුරු නාමය - රසායනාගාර තාක්ෂණික ශිල්පී**
**සේවා ගණය - කළමනාකරණ සහකාර - තාක්ෂණික**

**පුරප්පාඩු ගණන -04**

**10.1 සුදුසුකම්**

**10.1.1** <u>බාහිර අයදුම්කරුවන්</u>

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක රසායනාගාර තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**10.1.2** <u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**10.2 වැටුප් කාණ්ඩය** - MA 2-1

**10.3 වැටුප් පරිමාණය** - රු. 30,310 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 - 50,940/- කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව 2019 වර්ෂයේ මූලික වැටුප රු. 27,170/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**10.4 වයස :** අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**11. තනතුරු නාමය - තොරතුරු තාක්ෂණ සහකාර**
**සේවා ගණය - කළමනාකරණ සහකාර - තාක්ෂණික**
**පුරප්පාඩු ගණන -02**

**11.1 සුදුසුකම්**

**11.1.1** <u>බාහිර අයදුම්කරුවන්</u>

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**11.1.2** <u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**11.2 වැටුප් කාණ්ඩය** - MA 2-1

**11.3 වැටුප් පරිමාණය** - රු. 30,310 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 - 50,940/- කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව 2019 වර්ෂයේ මූලික වැටුප රු. 27,170/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**11.4 වයස :** අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**12. තනතුරු නාමය - පර්යේෂණ සහකාර**
**සේවා ගණය - කළමනාකරණ සහකාර - තාක්ෂණික**

පුරප්පාඩු ගණන -04

**12.1 සුදුසුකම්**

**12.1.1 බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද උසස් අධ්‍යාපන ආයතනයකින් සංඛ්‍යානය, පර්යේෂණ, මත්ද්‍රව්‍ය දුර්භාවිත කලමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව/ සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව වැනි ජාතික වෘත්තීය කුසලතා (NVQ) පස් (05) වැනි මට්ටමට නොඅඩු වන්නාවූ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**12.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**12.2 වැටුප් කාණ්ඩය** - MA 2-1

**12.3 වැටුප් පරිමාණය** - රු. 30,310 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 - 50,940/- කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 27,170/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**12.4 වයස :** අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**13. තනතුරු නාමය - කළමනාකරණ සහකාර**

**සේවා ගණය - කළමනාකාර සහකාර - තාක්ෂණික නොවන**

**පුරප්පාඩු ගණන -05**

**13.1 සුදුසුකම්**

**13.1.1 බාහිර අයදුම්කරුවන්**

(අ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

i. සිංහල / දෙමළ
ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම/ යතුරුලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන්)

**13.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ‘ආ’, ‘ඇ’ සහ ‘ඉ’ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

i. සිංහල / දෙමළ
ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06)කින් සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම්/ යතුරුලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන්)

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**සටහන්:-**

යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාලපරිච්ඡේද ඉහත "ආ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

**13.2 වැටුප් කාණ්ඩය - MA 1-1**

**13.3 වැටුප් පරිමාණය** - රු. 27,910 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 - 48,540/- කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 25,018/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**13.4 වයස :** අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**14. තනතුරු නාමය - රියදුරු**
**සේවා ගණය - ප්‍රාථමික - ශිල්පීය**
**පුරප්පාඩු ගණන - 02**

**14.1 සුදුසුකම්**
**14.1.1** <u>බාහිර අයදුම්කරුවන්</u>

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් සමත් වී තිබිය යුතුයි.

**ප්‍රවීණතා**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. මෝටර් රථ රියදුරන් රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**14.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රාථමික - ශිල්පීය නොවන සහ අර්ධ ශිල්පීය සේවා ගණයන්හි සේවකයකු වීම හා රියදුරු බලපත්‍ර සහ පළපුරුද්ද ලබා තිබීම.

**14.2 වැටුප් කාණ්ඩය - PL 3**

**14.3 වැටුප් පරිමාණය** - රු. (26,290 – 10 x 270 – 10 x 300 – 10 x 330 – 12 x 350 -රු:39,490/-) කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව 2019 වර්ෂයේ මූලික මාසික වැටුප රු. 23,566/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

**14.4 වයස :** අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.**

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය**

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් යොමු කල යුතුය.

**බඳවාගැනීමේ ක්‍රමවේදය**

බඳවාගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරඟ විභාගයක හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

ඔබගේ තොරතුරු "A4" ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ : (www.nddcb.gov.lk) ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ **2019.04.26** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ/ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරින් තම අයදුම්පත් ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

**අසම්පූර්ණ හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.**

**සභාපති**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**
**383, කෝට්ටේ පාර,**
**රාජගිරිය.**

ප්‍රකාශිත දිනය : 2019.03.27